# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>**My No** DSD/HQ/IT/11/CRM/Projec | ඔබේ අංකය<br>உமது இல<br>**Your No** ........................................ | දිනය<br>திகதி<br>**Date** 2021.09.18 |

සියළුම

දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,

ප්‍රාදේශීය ලේකම්,

සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සමෘද්ධි සහකාර අධ්‍යක්ෂ,

සමෘද්ධි කළමනාකරුවන් හා සමෘද්ධි සංවර්ධන නිලධාරිවරුන් වෙත,

**2021 වසරේ ක්‍රියාත්මක ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති වල ප්‍රගතිය**

**CRM මොඩියුලයට ඇතුලත් කිරීම.**

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව හා සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයංරැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය එක්ව 2021 වසරේ සමෘද්ධි හා අඩු ආදායම්ලාභී පවුල් වල ජීවනෝපාය සංවර්ධනය සඳහා විශාල ව්‍යාපෘති ප්‍රමාණයක් හඳුන්වා දෙන ලදි. එම ව්‍යාපෘති ඉල්ලීම් සියල්ල CRM මොඩියුලය වෙත ඇතුලත් කර අවශ්‍ය අනුමැතිය ලබාදීම රේඛීය ආයතන සමඟ සම්බන්ධීකරණය සිදු කිරීම්, ප්‍රතිපාදන නිදහස් කිරීම් වැනි කාර්යයන් සිදුකර ඇත.

02. මේ වන විට සියලුම ව්‍යාපෘති සඳහා විස්තරාත්මක ඉල්ලීම් CRM මොඩියුලය මඟින් සිදුකර ඇත. එම කරණ ලද ඉල්ලීම් ක්‍රියාත්මක කිරීමේ දී ක්‍රියාත්මක ප්‍රගතිය ඇතුළත් කිරීමට හා ක්‍රියාත්මක තත්ත්වය පිළිබඳ ප්‍රගති වාර්තා ලබා ගැනීමට CRM මොඩියුලය යාවත්කාලීන කර ඇත. එම නිසා දැනට ඔබ සිතුව ඇති අනුමත වී


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor,

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி (நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி)<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

ක්‍රියාත්මක මට්ටමේ ඇති සියලු ව්‍යාපෘති වල තොරතුරු CRM මොඩියුලයට ඇතුලත් කළ යුතුය.

**CRM මොඩියුලයට ප්‍රගතිය ඇතුළත් කිරීමේ ක්‍රියාවලිය පහත පරිදි වේ.**

1. CRM මොඩියුලය තුළ ව්‍යාපෘති වල ප්‍රගතිය ඇතුලත් කිරිම සඳහා වසමේ සංවර්ධන නිලධාරිට, සමෘද්ධි බැංකුවට හා බැංකු සමිතියට ලබා දී ඇති UserName හා Password භාවිතයෙන් පද්ධතියට පිවිස සිදුකළ හැකිය.
2. CRM පද්ධතියට crm.esamurdhi.gov.lk යන වෙබ් ලිපිනයෙන් පිවිස ප්‍රධාන මෙනුව තුළ ඇති "Project Applicants 2021" Click කිරීමෙන් පසු ලැබෙන Drop Down එක භාවිතයෙන් භාවිතකරුට අවශ්‍ය වසම දක්වා තෝරා Submit කළ පසු මේ වන විට ව්‍යාපෘති ඉල්ලා ඇති නාම ලේඛනය දිස්වේ.
3. එම ලේඛනයේ නම ඉදිරියේ ඇති Feedback බටනය Click කර ප්‍රගතිය ඇතුලත් කිරීමේ පිටුවට පිවිසිය හැකිය.
4. එම ප්‍රගතිය ඇතුලත් කිරීමේ පිටුව තුළ
    i. ව්‍යාපෘතියට අනුමත කළ දිනය
    ii. වෘත්තීය පුහුණු සඳහා 6000 ක පමණ ඉල්ලීම් කර ඇති නිසා වෘත්තීය පුහුණු සඳහා තෝරාගෙන ඇති ද, පුහුණුව ලබා දෙන ආයතනය කුමක් ද, පුහුණු කාලය කොපමණ ද හා පුහුණුව ආරම්භ කළේ ද යන්න ඇතුළත් කළ යුතුය.
    iii. මේ සඳහා උපකරණයක් ලබා දෙනවාද යන්න
    iv. ප්‍රසම්පාදනය ආරම්භ කළ දිනය
    v. භාණ්ඩය මිලදී ගත් දිනය
    vi. මිලදී ගත් උපකරණය
    vii. මේ සඳහා වූ සත්‍ය වියදම / වියදම දැරූ ආකාරය
    viii. අදාළ භාණ්ඩ ව්‍යාපෘති හිමියාට ලබාදුන් දිනය
    ix. ව්‍යාපෘති හිමියා ව්‍යාපෘතිය ආරම්භ කළ දිනය
    x. රේඛීය ආයතන වලින් ලබාදුන් දායකත්වය

    වැනි ආරම්භක ව්‍යාපෘතියේ තොරතුරු හා ව්‍යාපෘතියේ වර්තමාන ක්‍රියාත්මක තත්ත්වය ඇතුලත් කිරීම සඳහා සකස් කර ඇත.
5. මෙම තොරතුරු වලින් තොරතුරු ඇතුලත් කරනු ලබන දිනයට එම ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වයට අදාළ තොරතුරු සම්පූර්ණ කර Submit බටනය මඟින් පද්ධතියට ඇතුලත් කළ යුතුය. මෙම තොරතුරු සාර්ථකව ඇතුලත් වූ බවට පණිවිඩයක් පද්ධතිය දෙනු ඇත.
6. මෙම තොරතුරු ඇතුළත් කිරීමට ව්‍යාපෘතිය ආරම්භ කරන තෙක් සිටිය යුතු නොවන අතර, එය අනුමත වූයේද, ප්‍රසම්පාදන කටයුතු අරම්භ කර ඇතිද, වැනි අවස්ථා වලට අදාළ දින ඇතුලත් කර Submit කර පද්ධතිය යාවත්කාලීන කළ යුතුය.
7. ව්‍යාපෘති අනුමත කර ඇති ප්‍රමාණය හා එය ආරම්භ කරනු ලබන අවස්ථාව දක්වා ව්‍යාපෘතියේ ප්‍රගතිය අවස්ථා කිහිපයකදී ලබාගත හැකි ආකාරයට වාර්තා

සකස් කර ඇත. එම නිසා සෑම ව්‍යාපෘතියකම වර්තමාන තත්ත්වය CRM මොඩියුලයේ යාවත්කාලීන කළ යුතුය.

8. මෙම තොරතුරු යාවත්කාලීනව පවත්වාගෙන යෑම සෑම ව්‍යාපෘති කලමනාකරුවෙකුගේ ම වගකීමකි.

ක්‍රියාත්මක ව්‍යාපෘතිවල ප්‍රගතිය ලබා ගැනීම CRM මොඩියුලයේ ඇති තොරතුරු මත පදනම්ව සිදු කරන බැවින් ඔබ ප්‍රදේශයේ ක්‍රියාත්මක ව්‍යාපෘති වල ප්‍රගතිය දිනපතා CRM පද්ධතියේ යාවත්කාලීනව තබා ගත යුතුය.

9. මෙම කාර්යය සාර්ථක කර ගැනීම සඳහා ඔබ දක්වන දායකත්වය අගය කොට සලකමි.

ආර්.පී.බී.තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් -

1. රාජ්‍ය ලේකම් ( සමෘද්ධි, ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයංරැකියා, ව්‍යාපාර සංවර්ධන)
2. සියලුම අංශ ප්‍රධානීන් ( සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව)
3. ප්‍රධාන අභ්‍යන්තර විගණක ( සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව)